# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## මිළ ගණන් කැඳවීමයි

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සත්ව ආහාර/ අතිරේක ආහාර ද්‍රව්‍ය සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2025

**කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය. SLA/S&T/03/INTERIM RATIONS/ANIMAL RATIONS/2025(08)**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන්, ශ්‍රී ජයවර්ධනපුර ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31** දක්වා වන කාල සීමාව තුළ පහත දක්වා ඇති කඳවුරු වෙනුවෙන් සත්ව ආහාර/අතිරේක සැපයීම සඳහා ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

| කාණ්ඩය | කඳවුරු/මූලස්ථානය |
|---|---|
| සුනඛ ආහාර | රත්මලාන<br>පනාගොඩ<br>අනුරාධපුරය<br>හිඟුරක්ගොඩ<br>පලාලි<br>කිලිනොච්චිය<br>දියතලාව |
| අශ්ව ආහාර / අතිරේක | දියතලාව |

2. ලංසු කැඳවීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය තුළින් සිදු කරනු ලැබේ. ලංසු තැබිය හැක්කේ දේශීය ලංසුකරුවන්ට පමණි. ලංසු ලේඛනය තුළ එක් එක් ආහාර / අතිරේක කාණ්ඩවල පිරිවිතරයන් සහ විස්තර සපයනු ලැබේ.

3. ලංසුකරුවා අසාධු ලේඛනගතව නොසිටිය යුතු අතර, පහත අවම යෝග්‍යතා නිර්ණායක සැපිරිය යුතු ය.

   3.1. ආසන්නතම මූල්‍ය වර්ෂ දෙකක් (02) ඇතුළත මූල්‍ය වසර එකක් (01) සඳහා ආහාර සැපයුම් ක්ෂේත්‍රයේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රු. මිලියන 01 ක් විය යුතු අතර, අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය.

   3.2. අවම වශයෙන් රු.මිලියන 1.5 ක ද්‍රවශීල වත්කම් (අතැති මුදල්, බැංකුවේ මුදල්, කෙටි කාලීන ආයෝජන සහ ලැබිය යුතු ගිණුම්) ඇති බව 2023/ 2024 මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව තහවුරු කළ යුතුය. කෙසේ වෙතත් ලංසුකරු ලංසු සමග විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ නම්, පශ්චාත් සුදුසුකම් සනාථ කිරීමේ අදියරේදී **2024.09.30 ට පෙර** විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

   3.3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් (මෙම ටෙන්ඩරය සඳහාම) සපයනු ලබන අවම ණය සීමාව රුපියල් මිලියන 1 විය යුතුයි.

   3.4. සත්ව හා අතිරේක ආහාර ලංසුකරු සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක.) අමතර විස්තර ලංසු ලේඛනය මගින් සපයනු ලැබේ.

4. ලංසු ලේඛන නිකුත් කිරීම, ඉදිරිපත් කිරීම සහ භාරගැනීම අවසන් කිරීම සඳහා වන දින පහත පරිදි වන අතර, අදාළ ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කිරීමට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   | | | |
   |---|---|---|
   | අ. | ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කිරීම | - 2024.10.25 |
   | ආ. | ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | - 2024.11.27 දින ප.ව.3.00 දක්වා |
   | ඇ. | ලංසු ඉදිරිපත් කළ යුතු/ මුද්‍රා තබන අවසාන දිනය සහ වේලාව | - 2024.11.28 දින පෙ.ව.11.00 දක්වා |

5. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, යුද්ධ හමුදා මූලස්ථානය, යුද්ධ හමුදා මූලස්ථාන රථ ගාල, ශ්‍රී ජයවර්ධනපුර යන ස්ථානයේදී ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

6. නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් පසු 11 ඡේදයේ ඇති ලිපිනයේ අධ්‍යක්ෂ ජෙනරාල්, සැපයුම් සහ ප්‍රවාහන, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියවුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය. නැවත ගෙවනු නොලබන ගාස්තු, 2016.06.17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 06/2016 අනුගමනය කර තිබිය යුතුය. (ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නැවත ගෙවනු නොලබන ගාස්තුව ලබා ගත හැකිය.)

7. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් ලංසු ලේඛනයේ දී ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කළ යුතුය. මුද්‍රා තබන ලද මුල් ලංසුව සහ මුද්‍රා තබන ලද පිටපත වෙන වෙනම එක් මුද්‍රා තබන ලද කවරයකට බහා, ඉහත 4 ඡේදය තුළ දක්වා ඇති දිනය හා වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, නැතහොත් යුද්ධ හමුදා මූලස්ථානය, යුද්ධ හමුදා මූලස්ථාන රථ ගාල, ශ්‍රී ජයවර්ධනපුර යන ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය.

8. **ලංසු 2025.05.31 දක්වා** වලංගු විය යුතුය.

9. ඉදිරිපත් කරනු ලබන ලංසුව සමග 2025.05.31 දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණයක් යුද්ධ හමුදාධිපති නමට ඉදිරිපත් කළ යුතු ය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) කොන්දේසි විරහිතව ඉල්ලුම මත ලබා දෙන ලංසු සුරක්ෂණය සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වටිනාකම මිල දී ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

10. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබාගත හැකි අතර, ඊට අදාල ලංසු ලිපි ලේඛන පහත ඡේද අංක 11 යටතේ දක්වා ඇති ලිපිනයේ දී කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව **2024.10.25 සිට 2024.11.27 දින දක්වා සතියේ වැඩ කරන දිනයන් හි පෙ.ව.09.00 සිට ප.ව.3.00** දක්වා පරීක්ෂා කළ හැකිය.

11. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ,

| | | |
|---|---|---|
| අවධානයට | : | අධ්‍යක්ෂ ජෙනරාල්, සැපයුම් සහ ප්‍රවාහන |
| ලිපිනය | : | යුද්ධ හමුදාධිපති<br>යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර. |
| දුරකථන අංක | : | 011-2302569, 011-2302568 |
| ඊමේල් | : | **dtesandt@army.lk**<br>**dteofsuptender@gmail.com** |

**යුද්ධ හමුදාධිපති,**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,**
**ශ්‍රී ජයවර්ධනපුර.**

SELACINE